# භික්ෂු ආදර්ශය


අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨයෙහි පුස්තකාලයාධිපති රාජකීය පණ්ඩිත
**අම්බලම්ගොඩ පඤ්ඤාවංස අධිකරණ නායක ස්ථවිරපාදයන් වහන්සේ**
විසිනි.


මෙහි භික්ෂු යනුවෙන් භික්ෂුත්වය මැ අදහස් කරනු ලැබේ. එබැවින් මෙහි භික්ෂුත්වය මැ දක්වනු ප්‍රාස්තාවිකය. භික්ෂුත්වය වැලිත් බුද්ධෙන්ද්‍රියයෙන් මැ ප්‍රත්‍යක්ෂ කටයුත්තේය. බුඩ ශාසනය නමුත් ශුද්ධ භික්ෂුත්වය මැ මිස අනිකක් නොවන්නේය. ලොවැ මැ ඇති අනවද්‍ය පුද්ගලත්වය ද මේ භික්ෂුත්වය මැයි. අදීනත්වයෙන් මෙන් මැ අනූනත්වය හා නිර්දෙෂත්වයෙන් තේජාන්විත වූ මැ සුපරිශුද්ධ ධර්ම පුඤ්ජයක් භික්ෂුත්වය යනුවෙන් හඳුන්වනු ලැබේ. එම ධර්ම පුඤ්ජය නැතහොත් භික්ෂුත්වය ධරා සිටින ස්කන්ධ සන්තතිය (සත්වයා) ද භික්ෂු නම් වන්නේ ය. හේ යැ අනවද්‍ය පුද්ගලයා ය.

භික්ෂු ජීවය: ස්කන්ධ සන්තතියක් මෙන් මැ භික්ෂුත්වය ද ජීවිතය , ප්‍රධානතමාවයව ය, අන්වාවයවය, වාහ්‍යාභ්‍යන්තර පරිසරය යන මොවුන්ගෙන් උපයුක්ත වන්නේ ය. ජීවිතේන්ද්‍රියයෙන් (ජීවිතයෙන්) තොරවීම ස්කන්ධ සන්තතිය ගේ මරණය වන්නා සේමැ සතර පාරාජිකාවන් අතුරෙන් එකකට පැමිණීම භික්ෂුත්වයේ මරණය වන්නේ ය. සතර පාරාජිකාපත්තීන්ට නො පැමිණීම මැ භික්ෂුජීවය වන බැවිනි.

ප්‍රධානතමාවයව: අතපය ආදිය සත්වයාගේ ප්‍රධාන තම අවයව වන්නාසේ මැ සංඝාදිසෙසාපත්තීන්ට නොපැමිණීම භික්ෂුත්වයේ ප්‍රධාන තම අවයව වන්නාහ. සංඝාදිසෙස නම් වූ ගරු ආපත්තීන්ට පැමිණීම, සත්වයාගේ ප්‍රධානතම අවයව බිඳී යෑම මෙන් භික්ෂුත්වයේ ප්‍රධාන තම අවයව කැඩීබිඳී යෑමෙන් සත්ත්වයා අකර්මණ්‍යශීලී වන්නා සේ මැ සංඝාදිසෙස ශික්ෂාව්‍යතික්‍රමයෙන් භික්ෂුත්වය ද අකර්මණ්‍යශීලී වන්නේ ය.

අනුඅවයව: සත්ත්වයකුගේ ඇඟිලි ආදී අනුඅවයව (අප්‍රධානාවයව) කැඩීබිඳී යෑම් ආදියෙන් වුවද එම ජීවිතය අශෝභන වූ අප්‍රියජනක එකක් වන්නාසේ මැ භික්ෂුත්වයේ ද සෙසු අවයව වූ ථුල්ලච්චය, නිස්සග්ගිය, පාචිත්තිය, දුක්කට, දුබ්භාසිත යන ක්ෂුද්‍රානුක්ෂුද්‍ර ශික්ෂාව්‍යතික්‍රමයෙන් එම භික්ෂුත්වය ද අශෝභන වූ අප්‍රිය වූවක් මැ බවට පත්වන්නේ ය. සත්ව ජීවිතයේ ප්‍රධානතම අවයව සුන්බුන් කලැ බරපතළ ශල්‍යකර්මාදි වෛද්‍යොපදේශවලින් ද, අනු අවයව සුන්බුන් කලැ සාමාන්‍ය වෙදහෙද කම්වලින් ද සුව ලබා කර්මණ්‍ය කැරැ ගන්නාසේ මැ භික්ෂුත්වයේ ප්‍රධානතම අවයව සිඳීබිඳී යෑම වූ සංඝාදිසෙසයන් ගරුතම සංඝ කර්මවලින් ද සෙසු අවයවයන් සිඳීබිඳී යෑම වූ ක්ෂුද්‍රානුක්ෂුද්‍ර ආපත්තීන් ඇවැත් දෙසීම් ආදී විනයකර්ම වලින් ද ශුද්ධත්වය ලබා කර්මණ්‍ය කැරැගන්නේ ය. එසේ යලිත් ප්‍රකෘතිමත් බවට පත් වූ භික්ෂුත්වය පෙර තුබූසේ මැ ප්‍රභාස්වර වන්නේය. පූජ්‍යවන්නේ ය.

මෙසේ විනය නිකෂ පාෂාණයට ප.ගා ඔප්ලූ භික්ෂු රත්නය සැබැවින් මැ ශිෂ්ට ලොකයාගේ නෙත්‍රයනට අගණ්‍ය වූ රසාඤ්ජනයක් මැ වන්නේය. සිතට අනුපම සැනසිල්ලක් මැ වන්නේ ය. සංඝො පවජමානානං වරො'' යි ගම්නියම්ගම් නගරවල හැසිරෙනුවන් අතරැ සංඝ තෙමේ මැ උතුම''යි වදාළේ එහෙයිනි.

**නිග්‍රොධ සාමණේරයෝ:** නිග්‍රොධ සාමණේරයන් වහන්සේ ගේ ඒ ශාන්ත දර්ශනය සැට දහසක් තීර්ථකයන් ගේ අසංවර දර්ශනයෙන් වෙහෙසට හා කලකිරීමට පත් වෙමින් තුබූ ධර්මාශොක මහරජහුගේ නෙතට අගනා රසඳුනක් මෙන් මැ සිතට ඉමහත් සැනසිල්ලක් ද විය. ඒ මතු නොවැ ඒ ශාන්ත දර්ශනය මුළු ලොවට මැ අස්වැසිල්ලක් වූ හැටි ප්‍රකට ය. ධර්මාශොක මහ රජු පරම ධාර්මිෂ්ඨයකු වීමටත් එමගින් නොයෙක් දෙශවලැ ශුඬබුඬ ධර්මය පැතිරීයැමටත් ප්‍රබල හේතුව ඒ නිග්‍රොධ සාමණේරයන් වහන්සේගේ ශාන්ත දර්ශනය බව පැහැදිලිය.

**බෞඬ භික්ෂුව:** මොන තරම් ආකල්ප සම්පන්නදැයි මෙයින් වුව සිතා ගත හැකිය. ඇත්ත වශයෙන් හැම ඉරියව්වක මැ හැම බැලීමක මැ හැම කථා බහක මැ හැම ක්‍රියාවක මැ හැම තුෂ්ණීම්භාවයක මැ බෞද්ධ භික්ෂුව ශාන්ත ය. සිහි නුවණින් යුක්ත ය. මෙසෙයින් භික්ෂුත්වය ශිෂ්ටාචාරයේ පරම මූර්තිය යැයි කියයුතු තරම් ය. එහි කිසිත් අඩුවක් නොවන තරමට මැ අප බුදුරජාණන් වහන්සේ භික්ෂුත්වය පිළියෙල කොට ඇත.

**කන්දරක පරිබ්‍රාජකයා:** කන්දරක නම් පරිබ්‍රාජකයෙක් තුෂ්ණීම්භූත, වූ භික්ෂූන් වහන්සේ දැක, උන්වහන්සේගේ සංවරයෙහි හා ආකල්පයෙහි සම්පූර්ණත්වයට පැහැදී, මහත් වූ ප්‍රීතියෙන් පිරී ඉතිරී, භාග්‍යවතුන් වහන්සේට මෙසේ කී ''භවත් ගෞතම දන් ඔබ වහන්සේ විසින් යම්තරම් හොඳට භික්ෂූන් වහන්සේ පිළියෙල කරන ලදද, එය ආශ්වයර්යයි! එය අද්භූත යි.'' පෙර බුදුවරුන් විසින් ද මෙ පමණ මැ හොඳට භික්ෂූන් වහන්සේ පිළියෙල කරන ලදහයි ද, මතු ඇති වන බුදුවරුන් විසින් මෙපමණ මැ හොඳට භික්ෂූන් වහන්සේ පිළියෙල කරනු ලබන්නා හයි ද සිතමි''යි භාග්‍යවතුන් වහන්සේ ද,''එහෙම තමා කන්දරක, එහෙම තමා කන්දරක, මා දැන් පිළියෙල කරන ලද තරමට මැ හොඳට අතීත බුදුවරුන් විසින්ද භික්ෂූනු පිළියෙල කරන ලදහ. මතු බුදුවරුන් විසින්ද පිළියෙල කරනු ලබන්නාහ'' යි වදළ සේක. අසංවර සේ පිරිමඩුලු නොවනසේ හැඳීම් පෙරවීම්, භ්‍රාන්ත වූවන්සේ වටපිට බැලීම්, අත්වනමින් හිස සලමින් යැම් ඊම් බණ දහම් දෙසීම්, ආචාරශීලී නොවැ කෑම්පීම්, කෙළි සෙල්ලම් කැකෝ ගැසීම්, අඬදබර කිරීම් නඩුහබ කීම් භික්ෂූත්වයේ නම් කැලමැ නැත.

බුදුරජාණන් වහන්සේ සකුලුදායී පිරිවැජි අරමට වඩිති: එක් දිනෙකැ අප බුදුරජාණන් වහන්සේ රජගහනුවරට පිඬු පිණිස පිවිසියෝ කල්වේලා ඇති බැවින් එනුවරැ මෝර නිවාපයේ පරිබ්‍රාජකාරාමයෙහි සකුලුදායී පරිබ්‍රාජකයා වසන තැනට වඩින්නට අදහස් කොට එහි වඩිති. බුදුරදුන් වඩිනු දුරදීමැ දුටු සකුලුදායී උස් හඬින් මහ හඬින් ඝොෂ කරමින් අසංවරවැ උන් අතවැසි පිරිස, ''හා! හා'' නිහඬ වවු, ශ්‍රමණ ගෞතමයෝ එති, ඔවුහු අල්ප ශබ්ද කැමැත්තෝයි, මේත් අල්පශබ්ද පිරිසකැයි දැන මෙහි ආවොත් හොඳයි, එයින් අපේ ගරුබව වැඩිවන්නේ ය''යි සන්සුන් කළේ මහත් ආයාසයෙනි. බුදුරජාණන් වහන්සේත් එවිට මැ එහි වැඩිසේක. සකුලුදායීද පෙර ගමන් කොට, ''එන්න, එන්න පින්වත, ඔබ බොහෝ කලකින් මෙහි ආවාහුය, ඔබට ශුභ ගමනක් වේවා, වැඩ ඉන්න, මේ ආසනය පැනෙව්වා''යි කී. භාග්‍යවතුන් වහන්සේ වැඩහුන්හ. සකුලුදායී ද මිටි අසුනක් ගෙන එක් පසෙකින් උන්නේය. ''මොකක්ද උදායී, මා එද්දී තොප කථා කෙළේ''යි භාග්‍යවතුන් වහන්සේ ඔහුගෙන් ඇසූහ. සකුලුදායී මෙසේ කීය; ''ඒ ඔබට ඇසීමට දුර්ලභ කථා නො වෙයි. ඒවා තිබෙත්වා, දිනෙකැ කුතූහල ශාලාවෙහි රැස්ව හුන් නානාතීර්ථක බොහෝ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ මෙබඳු අතුරු කථාවක් වූ. ''පූරණ කස්සප ආදීහුය, ශ්‍රමණ භවත් ගෞතමය යන මේ ප්‍රසිඬ ශාස්තෘවරු හැම

දෙනා මැ වාගේ දූන් මේ අඟු මගධ දෙරට වස් වෙසෙති. ඒ වනාහී මේ දෙරටට මහත් ලාභයෙකි. මොවුනතුරෙන් කවරකු ඒ ඒ ශ්‍රාවකයෝ ගරු කරමින් ඇසුරු කැරෙද්දූයි එහි සමහරු මෙසේ කීහ.

"මේ පූරණ කස්සප තෙම බොහෝ ශිෂ්‍යයන් ඇති ගණාචාය්‍ය්‍යයෙකි. මැනැවැයි බොහෝ දෙනා පිළිගත්තෙකි. එහෙත් ඔහුගේ ශිෂ්‍යයෝ ඔහු ගරුකොට ඇසුරු නො කැරෙති; පෙර දවසෙකැ මෙබඳු සිඩියක් විය. පූරණ කස්සප තෙම නොයෙක් සිය ගණන් පිරිසට දහම් දෙසයි. එහි ඔහුගේ ශිෂ්‍යයෙක් ශබ්ද නගා 'ඔය කරුණ කාශ්‍යප ගෙන් නො අසවු, මාගෙන් අසවු; ඔය කරුණ හේ නො දනි"යි කීය. පූරණ කස්සප ද ඔහු ශබ්ද කිරීමෙන් වළකාලීමට මහත් වෙහෙසක් දැරී; ළෙහි දෙ අත් බැඳ හැඩී. එහෙත් ඔහු නිහඬ කළ හැකි නො වීය. අනික් ශාස්තෘවරුන් ගැන ද එහි මෙබඳු මැ විවේචන පළවූහ.

"සමහරු මෙසේ කීහ, ශ්‍රමණ ගෞතම යන්ගේ ශ්‍රාවකයෝ නම්, ස්වකීය ශාස්තෘ වරයා ගරුතන්හි තබා ඇසුරු කැරෙති; එහි පෙර වූ සිඩියක් ඇත. 'දිනක් ශ්‍රමණ භවත් ගෞතමයෝ නොයෙක් සිය ගණන් පිරිසට ධර්ම දේශනා කැරෙති. එහි එක් ශ්‍රාවකයෙක් කැරී, ඔහු ළඟමැ උන් අනික් ශ්‍රාවකයෙක් දණින් ගටා, ඔහුට නිහඬ වන සේ ඇඟවී. යම් වේලාවෙකැ යම් තැනෙ කැ ශ්‍රමණ භවත් ගෞතමයෝ දහම් දෙසද්ද, එහි එක ද ශ්‍රාවකයෙකුත් කිම්සීම් මාත්‍රයකුදු නොකැරෙයි. හැමදෙනා මැ, ඔවුන් මැ ඔවුන්ගේ දම් දෙසුම් මැ මහත් උනන්දු වෙන් මහත් නිහැඬියාවෙන් බලාපොරො ත්තුවෙති. සස්නෙහි නොඇලී සිවුරු හළහු පවා කිසි විටෙකත් ඔවුන් හෙළා නොදකිති. 'මෙබඳු උතුම් දහමක් පුරාගත නොහුණුමු'යි තමන්ට මැ උපවාද කැර ගනිති"යි බෞඩ භික්ෂුව කොතරම් විනීත ද යනුත් මෙයින් සිතාගත හැකිය.

අරමෙහි මැ වුව ද භික්ෂු තෙම සැබවින් විනීත වෙයි, සංවර වෙයි, නිහඬ වෙයි, රහ සෙහි වුව ද ඔහුගේ කායික වූ හෝ වාචසික වූ හෝ දවයෙක් (කෙළිසෙල්ලමෙක්) නැත. හේ ඉතා ශාන්තය. ඔහුගේ කායප්‍රගල්භ යෙක් වාග් ප්‍රගල්භයෙක් ඇත්තේ මැ නැත. සැබැවින් දෙඩමලු නොවන භික්ෂු තෙම, තමා ළඟ සිටින්නහුට පමණක් ඇසෙන සේ ප්‍රමාණවත් හඬින් සුදුසු කථාවක් මැ කැරෙයි. එබඳු කථාවක් නොවේ නම්, ආය්‍ය්‍ය වූ තුෂ්ණීම් භාවය මැ ඇසුරු කැරේ. දහස් ගණන් භික්ෂූන් ඇති ජේතවනාරාම යට ජීවක තුමා, අජාසත් මහරජු කැඳවා ගෙන යද්දී, එහි රජයූ නිහැඬියාව නිසා මැ 'ජීවකයා මා මරන්නට වත් ගෙනයනවාදැ'යි රජතුමා බිය ගත්තේය; ඒ අරම එතරම් මැ නිහඬ ය.

මෙසේ මේ උදර භික්ෂුත්වය නිකම් මැ පහළ වූවක් ද නො වේ. මේ වනාහි එයට නිසි වූ සුපරිශුඩ ප්‍රතිපත්ති පද්ධතියක ආභා සය වේ. දීඝනිකායෙහි එන 'සාමඤ්ඤඵල' සූත්‍රයෙහි එම ප්‍රතිපත්ති විකාශනය වැ ඇත. එහි ශීලය ප්‍රථමාඞ්ගය ගන්නේ ය. එද 'චූල්ල සීලය, මජ්ඣිම සීලය, මහා සීලය'යි ප්‍රභෙද ගතවේ.

භික්ෂුත්වයේ ආරම්භය: භික්ෂුත්වයේ ආරම්භය වනුයේ ගිහි ගෙය හැරදමා ශාසන යෙහි පැවිදි වීමෙනි. අචේලක පරිබ්‍රාජකා දීහු ද පැවිද්දෝ වෙති. එහෙත් ඔවුන් ගැන විචාරණයකට බැසීම අප අදහස නොවේ. අප අදහස් කරනුයේ ශ්‍රමණ ශාක්‍ය පුත්‍ර වූ නැතහොත් බුඩශ්‍රාවක වූ භික්ෂූන් වහන්සේ ය. බෙහෙවින් බුදුරදුන් දවසැ ශාසන ගත වූවෝ නම්, ගෘහ වාසයෙහි ආදීනවයන් (දෝෂයන්) දැක, එහි කල කිරුනෝ ය. එසේ මැ තමන් විඳින ගිහිසුවයට වඩා පැවිදි සුවය මැ උතුම්යි නුවණින් සැලකූ වෝ ද වෙති.

මෙය අතර මැ අන්‍යයන්ගේ බලකිරීම් උඩ ද සමහරු පැවිදි වූහ, ඔවුහු වනාහී

ගිහිගෙයි ඇති ආදීනවයන් වත් පැවිද්දෙහි අනුසස්වත් මුලදී සැලකූවෝ නො වූහ. ඔවුනතර තරුණයන් මෙන් මැළදරුවෝ ද වූහ. එහෙත් ඔවුහු නමුත් කල් යෑමෙන් සත්පුරුෂයන් ඇසුරු කිරීමෙන් සත්පුරුෂයන්ගේ ධර්ම හැදෑරීමෙන් ගිහිකම කෙලෙස් පථයකැයිද දුඃඛාණීවයකැයි ද, පැවිද්ද වනාහි බලවත් නිදහසක් මෙන් මැ නිවන් මග කැයි ද, මඳක් ප්‍රමාද වී හෝ දුන ගත්හ. එය ක්‍රියාත්මක කොට පැවිදිසුවය ලොවමැ අති උතුම් ශාන්ත සුවය බව ප්‍රත්‍යක්ෂ කළහ. ඔවුනතර නාලක, රාහුල, නන්ද, නිග්‍රොධ, මොග්ගලීපුත්ත, මහින්ද යනාදීහු දත යුත්තාහ.

**ශාසනාවගාහය:** තථ්‍යශාසනාවගාහය වනුයේ නම් මෙසේය. "**ඉතිපිසො භගවා අරහං**" යනාදීන් සුවිතත යශොඝොෂ ඇති **බුදුරජාණන් වහන්සේ** ලොවැ පහළ වෙති. ඔබ වහන්සේ **අත්‍යන්ත** පරිශුඪ වූ සර්ව **සම්පූර්ණ** වූ බ්‍රහ්මචර්‍ය්‍යය ප්‍රකාශ කොට ධර්මය දේශනා කරති. කවරකුලයෙකැ ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ එම ධර්මය අසයි. හේ එයින් තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රඬාව ලබයි. හේ එයට පසු මඳ වූ හෝ බොහෝ වූ හෝ භෝගයන්හා නෑයන් හැර දමා පැවිදි වෙයි. හේ එතැන් පටන් චුල්ල සීලය යනාදි වශයෙන් ප්‍රභේද ගත වූ ප්‍රාතිමොක්ෂ සංවර ශීලය පුරයි.

**චුල්ල සීලය:** හේ සතුන් මැරීම, සොරකම් කිරීම, මෛථුන සේවනය, බොරු කීම' කේලාම් කීම, පරුෂ වචන නිෂ්ඵල වචන, විකාලභෝජනය, මල්ගඳ විලවුන් දැරීම, සැරසීම, හැඬවීම, නැටීම් ගීකීම්, වැයීම් ආදී විසුලු කිරීම්, ඒවා බැලීම්, උසසුන් මහ අසුන් පරිභෝග කිරීම, රන් රිදී මසු කහවණු පිළිගැනීම යන මෙයින් වලකියි. තවද අමුධාන්‍ය, අමුමස්, ස්ත්‍රීන් කුමාරීන්, දසිදසුන්, හූරු කුකුළු ඇත් අස් ගව මහිෂාදීන්, කෙත්වතු ආදීන් නොපිළිගනියි. ගිහීන්ගේ මෙහෙවර දූතකම් පණිවිඩ පණත් ගෙනයෑම් ආදිය නො කරයි. වෙළඳම් මිල දී බඩු ගැනීම් ආදිය නො කරයි. හොරමැරකම් සැහැසිකම් ආදිය නො කරයි.

**මජ්ඣිම සීලය:** හේ බීජගාම භූතගාම (පැලවෙන ඇට ගස්වැල් ආදිය) නො නසයි. සන්නිධිකාර පරිභොගය (දේපල රැස් කොට තබා ගෙන පරිභොග කිරීම) නො කරයි. දෙශපාලන රැස්වීම් පෙළපාලි ආදියට එක් නොවෙයි. ඒවා බැලීමට ද නොයයි. සිරුර හැඩවැඩ ගැන්මට සම්බාහනකම් නො කරවයි. කුහකකම් ආදිය නො කරයි.

**මහාසීලය:** ඒ භික්ෂු තෙම ඔවුනොවුන් ඇඟ ලකුණු බලා ඵලාඵල කීම, ස්වප්න ඵලාඵල කීම, යන්ත්‍ර මන්ත්‍ර යාග හෝම කිරීම, මණිලක්ෂණ, කඩුලක්ෂණ, ආවුධ ලක්ෂණ, ස්ත්‍රී ලක්ෂණ, පුරුෂ ලක්ෂණ, චන්ද්‍රග්‍රහණ, සූර්‍ය්‍යග්‍රහණ, වැසි සුලබවීම දුලබවීම, සුභික්ෂවීම දුර්භික්ෂවීම, භය ඇතිවීම, ක්ෂේම ඇතිවීම කීම් ආදී තිරිසන් විද්‍යාවලින් ජීවිකාව නොකරයි.

තවද අංජනං බැලීම, ගැහැණුන්ට පිරිමින්ට භූතාවෙස කරවීම, කොඩිවින හූනියම් කිරීම්, ඒවා කැපීම් ආදී තිරිසන් විද්‍යාවලින් ජීවිකාව නොකරයි.

තව ද භික්ෂු තෙම ආවාහ විවාහ සංවිධාන (මඟුල් ජෝඩු) නො කරයි. විරුඬ අඹුසැමියන් සමගි කිරීමට, සමගි අඹුසැමියන් විරුඬ කිරීමට, දරුගැබ් ගැන්වීමට, ගැබ් හෙළීමට, යන්ත්‍ර මන්ත්‍ර යාග හෝම බෙහෙත් කිරීම් යෙදීම් ආදී තිරිසන් විද්‍යාවලින් ජීවිකාව නො කරයි.

තවද භික්ෂු තෙම, ශාන්තිකර්ම (භාර වීම්) ප්‍රණිධිකර්ම (භාර ඔප්පු කිරීම) භූරිකර්ම (බිම්ගෙයක හිඳ මන්ත්‍ර ජප කිරීම) පණ්ඩකයන් පිරිමින් කිරීම, පිරිමින් පණ්ඩකයන් කිරීම, මන්ත්‍ර බෙහෙත් ආදියෙන් බඩවිරේචන ළය විරේචන කිරීම්, ඇස් වෙදකම් ශරීර වෙදකම් ආදී තිරිසන් විද්‍යාවලින් ජීවිකාව නො කරයි.

මෙසේ සිල්වත් වූ භික්ෂු තෙම උපාධ්‍යායවත්, ආචාර්‍යවත්, ආගන්තුකවත්, නේවාසික වත්, විහාරාඞ්ගණ බොධ්‍යඞ්ගණ වත් ආදී ඛන්ධකාගත සියලුවත් පුරා වත් සපත් වෙයි. මෙසේ සිල්වත් වූ වත්සපන් භික්ෂු තෙම, මුළුමනින් සතුරන් දිනූ රජකු මෙන් කොහෙන් හෝ නො බිය වැ උතුම් වූ පැවිදිසුවයෙන් සුවපත් වැ නිර්මල වූ ආදර්‍ශයෙන් හා ධර්මානුශාසනයෙන් දෙව් මිනිසුන්ට ද වැඩ සිදුකැරේ.

මේ හොඳ භික්ෂු තෙම නිරතුරුකය පරිහරණයට ප්‍රමාණවත් සිවුරු (තුන්සිවුරු) ද, කුස පරිහරණයට යෝග්‍ය පාත්‍රය ද ස්වකීය බාහිරධනය කොට පවතියි. ඔහුට වෙන කිසිත් ධනයෙක් නැත. පරමාල්පෙච්ඡ නොවන භික්ෂුවක් කුඩ සෙරෙප්පු ආදී විනයානුගත මඳ පිරිකරකින් යුක්තවූයේ නමුත් එයින් භික්ෂුත්වය දූෂිත නොවන් නේයි. පන්සල් දේපල වතුපිටි භික්ෂුවට නැත. සඟසතු විහාර ආරාම දේපල භාරව සිටින තරමින් ඒවා තමාගේ මවුපියන් දුන් දැවැද්ද සේ සිතා සිතුකැමැත්තට පරිභෝග කිරීම භික්ෂුවගේ නම් පැවැත්ම නොවන්නේ ය. අධිපතිය යි, නායකයයි, ප්‍රධානයයි උදම් වැ සංඝලාභ අයථා මාර්ග වල යෙදී මෙක් භික්ෂුවගේ නම් ඒකාන්ත යෙන් මැ නැත. බුදුරජාණන් වහන්සේ අධිපතිකම් කළ, ශාරීපුත්‍ර මෞද්ගල්‍යායන මහා ස්ථවිරයන්වහන්සේ අධිපතිකම් කළ පන්සලක් නැත. ''සැරියුත් මුගලන් දෙනම, භික්ෂුවගේ හැඩ ගැසීමේ තුලාවය, මිම්ම ය''යි බුදුරදුන් වදරා ඇත.

භික්ෂූන් වහන්සේට දේපල නැත්තා සේ ම උන්වහන්සේ විසින් ධර්මයෙන් මුත් ආමිසයෙන් පෝෂණය කරනු ලබන්නෝ ද නැත. එබැවින් මැ උන්වහන්සේට අනඤ්ඤපොසී යනු ශාසනික නාමයෙකි. මෙසේ අකිංචන වූ අනඤ්ඤපොසී වූ භික්ෂුත්වය දුක විස්මයට පත් වූ පොහොසත් බමුණෙක් මෙසේ කියයි.

''ඇත්තවශයෙන් මැ මේ ශ්‍රමණයාට, මට මෙන් නැති වී අදට සැටදවසක්වන ගවයන් තුදුස් දෙනෙක් නැත. පාලු වී ගිය තලකෙත්ද නැත. එලූ ගමන් සත්මසක් ගත වූ, එය නිසා මැ මකුණු මැකිණි ආදීන් ගැවසී ගත් නිදන ආසනයක් ද නැත. පුතුන් එකා දෙන්නා ඇති කණවැන්දුම් දූන් සත් දෙනෙක්ද නැත. නිදිගත් සැමියා පයින් ඇන පුබුදු කරවන, හටගත් තල කැලල් (අලුහම්) ඇති දුඹුරුවන් බිරිඳක් ද නැත. උදෑසන මැ ගෙදෙර සිට ''අපෙන් ගත් ණය දෙවු, දෙවු''යි ඉල්ලන ණයහිමියෝ ද නැත. එසේ හෙයින් මේ ශ්‍රමණයා සැපසේ වෙසෙ යි. ඒ සියල්ල ඇති මට මෙ උතුම් සැපය නැත'' යනු යි. කවර තරමක හෝ දේපල ඇති, ගිහි කම්වලින් පැමිණි හිරිහැර ඇති කවර ගිහියකු වුව ද අකිංචන භික්ෂුත්වය දුක, මෙසේ පැවසීම හෝ සිතීම නොවැළක් විය හැකිය. ඒ තරම් මැ ශාන්ත සැපයක් භික්ෂුත්වයට ඇත.

මෙසේ සිල්වත් වූ සංවරවූ අල්පෙච්ඡ වූ විවෙකී වූ, තවදුරටත් ගුණ වඩා පූර්වෙ නිවාසානුස්මෘතිඥානය, සත්වයන් ගේ චුති උත්පත්ති දක්නා දිව්‍ය චක්ෂුරභිඥානය, ආෂවක්ෂයකරඥානය ද ලබා ඇති උපරි මැ භික්ෂුත්වය කොතරම් ප්‍රභාස්වර වේ ද, කොතරම් ජනප්‍රිය වේ ද, කොතරම් අගනා නෙත්‍රරසාඤ්ජන වේ ද, කොතරම් ජනහෘදයාස්වස්ථදයී වේ දැයි වචනයෙන් කිය හැකි නො වේ. ලිපියෙන් දක්විය හැකි නො වේ. ශ්‍රද්ධා බුද්ධිසම්පන්න වූ චූළසුභද්‍රා නම්, අනේපිඩු සිටුහු ගේ දූ ඒ උතුම් භික්ෂුත්වය මෙසේ දකී යි.

1. ''ඒ භික්ෂූන් වහන්සේ ඉතා ශාන්ත ය, උන්වහන්සේ ගේ ඇස් කන් ආදී ඉන්ද්‍රියයෝ ඉතා සන්සුන්හ, උන්වහන්සේ ගේ ගමනත් සිටීමත් එසේ මැ ශාන්තය. උන්වහන්සේ පහත හෙලූ ඇස් ඇත්තෝ ය. ප්‍රමාණවත් කථා ඇත්තෝ ය. මා ගේ ශ්‍රමණයෝ එබඳුහ. 2. උන්වහන්සේ ගේ

කායකර්මය පවිත්‍රය. වාක් කර්මය නිරවුල් ය. මනඃ කර්මය අතිශයින් පිරිසිදු ය. 3. උන්වහන්සේ ලියවා සුදුකළ හක්ගෙඩියක්සේ ඇතුළත පිටත දෙක්හි මැ සුවිශුඩ ය. ශුඩ ධර්මයත් ගෙන් පිරුණාහ. 4. උන්වහන්සේ ලාභයෙන් උදම් වන, අලාභයෙන් තැවෙන, ලොකයාමෙන් නොවැ, ලාභ අලාභ දෙක්හි මැ එකාකාරයහ 5. උන්වහන්සේ යසසින් උදම් වන, අයසසින් තැවෙන ලෝකයා මෙන් නොවැ, යස අයස දෙක්හි මැ එකාකාරයහ. 6. උන්වහන්සේ ප්‍රශංසාවෙන් උදම් වන, නින්දවෙන් තැවෙන, ලෝකයා මෙන් නොවැ, නින්ද ප්‍රශංසා දෙක්හි මැ එකාකාරයහ. 7. උන්වහන්සේ සැපයක් ලත් විට උදම් වන දුකක් ලත් විට තැවෙන, ලෝකයා මෙන් නොවැ, සැප දුක් දෙකෙන් මැ කම්පා නො වන්නාහ. මාගේ ශ්‍රමණයන් වහන්සේ එබඳුහ'' යනු වෙති.

භික්ෂූන් වහන් සේ නම්, පිරිසිදු ශීලයෙන්, මනාසංවරයෙන්, පිරිපුන් ආකල්පයෙන්, පරිශුඩාජීවයෙන්, යෝග්‍ය වූ ධර්මානු ශාසනයෙන්, විශාරද වූ නුවණින්, ශාසනානු ලෝමික ව්‍යක්තභාවයෙන්, විනීත වූ පැවැත්මෙන්, ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙන් මුත්, ජනයාගේ ලෞකික අඩුපාඩුකම් සපුරා ලීමෙන්, ඔවුන්ගේ ගොවිතැන් වෙළ හෙළඳම්වලට ගුරු හරු කම් දීමෙන් උසස් උසස් පදවි තනතුරු දුරීමෙන් ගෙන් ගෙට ගොස් ගිහීන් ගේ දුක්සැප සොයා බැලීමෙන් ඔවුන්ට කැම්බීම් ආදියෙන් සංග්‍රහ කිරීමෙන් ආදී ශාසනානු ලෝමික නොවූ ව්‍යාපාරවලින් ජනප්‍රිය වීමට නොසිතන්නාහ. එයට උත්සාහ නො කරන්නාහ.

''සීලදස්සන සම්පන්නං
ධම්මට්ඨං සච්ච වේදිනං
අත්තනො කම්මකුබ්බානං
තං ජනො කුරුතෙ පියං''

ලෝවැසි ජනතෙම චතුපාරිසුද්ධි සීලයෙන් හා මාර්ගසම්ප්‍රයුක්ත මනා දශීනයෙන් යුක්ත වූ චතුරාර්‍ය්‍යසත්‍යයන් දන්නා වූ ත්‍රිවිධ ශික්ෂා පිරීම් නැමැති ස්වකීය කර්ම කරන්නා වූ භික්ෂුව ප්‍රිය කැරේ. (පූජාකරනු කැමැත්තේ ය.)